## බළන්ගොඩ නගර සභාව

## 2022-12-09 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.12.09**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

1. ගරු සභාපති — ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා
2. ගරු උප සභාපති — එම්.ටී.එම්.රූමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී — ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී — චමික ජයමිණි විමලසේන මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී — ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී — නිමල් කරුණාරත්න මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී — එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රී — නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
9. ගරු නාගරික මන්ත්‍රිනි — ජී. චන්ද්‍රලතා මැතිතුමිය
10. ගරු නාගරික මන්ත්‍රී — එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා
11. ගරු නාගරික මන්ත්‍රී — එම්. ඩබ්. විමලසිරි මැතිතුමා
12. ගරු නාගරික මන්ත්‍රිනී — පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය
13. ගරු නාගරික මන්ත්‍රිනී — සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය
14. ගරු නාගරික මන්ත්‍රිනි — එම්. ශාන්තිලේඛා මැතිතුමිය
15. ගරු නාගරික මන්ත්‍රී — කේ. ජී. පේමදාස මැතිතුමා
16. ගරු නාගරික මන්ත්‍රිනී — මංගලිකා ඉලංකෝන් මැතිතුමිය
17. ගරු නාගරික මන්ත්‍රී — එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් ඞී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා

**01. පසුගිය සභාවේ 2022-11-08 දිනැති මහා සභා වාර්තාව හා 2022.11.16 දිනැති විශේෂ මහ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2022-11-08 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-11-16 දිනැති විශේෂ මහ සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා, 2022-11-08 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-11-16 දිනැති විශේෂ මහ සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රීනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022-11-08 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-11-16 දිනැති විශේෂ මහ සභාවේ වාර්තාව ගරු සභාවේ සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය හා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනය විසින් වාර්ෂිකව සංවිධානය කරන හොඳම ගිණුම් හා වාර්ෂික වාර්තාව සඳහා වූ තරගාවලියේ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන අතරින් 2020 වර්ෂයට අදාලව හොඳම ගිණුම් හා වාර්ෂික වාර්තාවට හිමි රන් සම්මානය බළන්ගොඩ නගර සභාව හිමි කර ගත් අතර, එහි සමස්ථ රන් ශූරතාවය ද හිමි කර ගැනීමට හැකි වූ බව ද ඒ සම්බන්ධව කැපවූ නගර සභාවේ සියලු නිළධාරීන් වෙත ස්තුතිය පළ කරන බව ද පවසන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

අද දින සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් නොවුණි.

ටෙන්ඩර්පත් විවෘත කිරීමේ නියමිත වේලාව පෙ.ව 10.30 බැවින් එතෙක් න්‍යාය පත්‍රයේ යෝජනා සාකච්ඡා කර අනුමත කර ගැනීම සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

04:01 රථවාහන නැවතුම් ගාස්තු අය කිරීම සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

04:02 පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

04:03 පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

04:04 පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

04:05 බළන්ගොඩ බැංකියවත්ත ප්ලාස්ටික්/පොලිතින් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

04:06 දූන්වීම් පුවරු 10 සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

04:07 පොදු වෙළඳසැල අංක 11 මාළු කඩ කාමරය සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

04:08 පොදු වෙළඳසැල අංක 12 මාළු කඩ කාමරය සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

04:09 පොදු වෙළඳසැල අංක 14 මාළු කඩ කාමරය සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

04:10 පොදු වෙළඳසැල අංක 18 මාළු කඩ කාමරය සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

ටෙන්ඩර්පත් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

04:01 රථවාහන නැවතුම් ගාස්තු අය කිරීම සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

රථවාහන නැවතුම් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරය සඳහා එක් ලංසුපතක් නිකුත් වූ අතර එම ලංසුපත ලැබී තිබුණි. එහිදී ජී.ඒ. සුජීව කුමාර යන අය විසින් ඉදිරිපත් කර තිබූ මාසික ලංසු මුදල වන රු.120,300.00 ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

04:02 පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරය සඳහා ලංසුපත් 02ක් නිකුත් වූ අතර එම ලංසුපත් දෙකම ලැබී තිබුණි. එහිදී වැඩිම ලංසු මුදල වශයෙන් සුධීර චතුරංග යන අය විසින් ඉදිරිපත් කර තිබූ රු.142,650.00 ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

04:03 පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය සඳහා ලංසුපත් නිකුත් වී නොතිබුණි.

04:04 පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය සඳහා ලංසුපත් නිකුත් වී නොතිබුණි.

04:05 බළන්ගොඩ බැංකියවත්ත ප්ලාස්ටික්/පොලිතින් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

බළන්ගොඩ බැංකියවත්ත ප්ලාස්ටික්/පොලිතින් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා එක් ලංසුපතක් නිකුත් වූ අතර එම ලංසුපත ලැබී තිබුණි. එහිදී කේ.ඩබ්. මංජුල නන්දන යන අය විසින් ඉදිරිපත් කර තිබූ මාසික ලංසු මුදල වන රු.25,000.00 ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

04:06 දැන්වීම් පුවරු 10 සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

දැන්වීම් පුවරු 10 සඳහා ලංසුපත් නිකුත් වී නොතිබුණි.

04:07 පොදු වෙළඳසැල අංක 11 දරණ මාළු කඩ කාමරය සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

පොදු වෙළඳසැල අංක 11 දරණ මාළු කඩ කාමරය සඳහා ලංසුපත් නිකුත් වී නොතිබුණි.

04:08 පොදු වෙළඳසැල අංක 12 දරණ මාළු කඩ කාමරය සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

පොදු වෙළඳසැල අංක 12 දරණ මාළු කඩ කාමරය සඳහා එක් ලංසුපතක් නිකුත් වූ අතර,එම ලංසුපත ලැබී තිබිණි. එහිදී මිරාන් කාවින්ද මුතුමාල යන අය විසින් ඉදිරිපත් කර තිබූ රු.10,150.00 ක මාසික ලංසු මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

04:09 පොදු වෙළඳසැල අංක 14 දරණ මාළු කඩ කාමරය සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

පොදු වෙළඳසැල අංක 14 දරණ මාළු කඩ කාමරය සඳහා ලංසුපත් 02ක් නිකුත් වූ අතර, එම ලංසුපත් 02 ම ලැබී තිබුණි. එහිදී වැඩිම ලංසු මුදල වශයෙන් ඉෂාන් කවිඳු මුතුමාල යන අය විසින් ඉදිරිපත් කර තිබූ රු.10,600.00ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

04:10 පොදු වෙළඳසැල අංක 18 දරණ මාළු කඩ කාමරය සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

පොදු වෙළඳසැල අංක 18 දරණ මාළු කඩ කාමරය සඳහා ලංසුපත් 04ක් නිකුත් වූ අතර, එම ලංසුපත් 04 ම ලැබී තිබුණි. එහිදී වැඩිම ලංසු මුදල වශයෙන් ඩී.වී. මිල්කා ෂාලිමා කාන්තා යන අය විසින් ඉදිරිපත් කර තිබූ රු.25,000.00ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලද ඉහතින් ලබාගන්නා තීරණ ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05. කල් දී ඇති ප්‍රශ්න**

**05:01 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

05:01:01 බුලත්ගම සුනන්දාරාම මාවතේ අනවසරයෙන් ස්ථාන දෙකක අවිධිමත්ව ඉදි කර ඇති මායිම් වැටවල් ඉවත් කිරීමට ගෙන ඇති පියවර කුමක් ද?

අදාල ඉඩමේ හිමිකරු සමග සිදු කළ ස්ථානීය පරීක්ෂණයේ දී ඉඩමේ එම කොටස මිනින්දෝරුවරයෙකු ලවා මායිම් ගල් යොදා දැනුම් දෙන ලෙසත් ඉන්පසු මායිම සම්බන්ධව තීරණයක් ගැනීම කළ යුතු බවත් එතෙක් පවතින තාවකාලික වැටෙහි අතු කපා දැමීමටත් මාර්ගයට නෙරා ඇති කොටස් ඉවත් කිරීමටත් උපදෙස් ලබා දී ඇති අතර, ඒ සඳහා අදාල පාර්ශවය එකඟත්වය පළ කර ඇති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

05:01:02 බුලත්ගම තලාවගෙදර මාර්ගයට අනතුරුදායක ලෙස පිහිටා ඇති බවට විශාල වශයෙන් මහජන පැමිණිලි ලැබී ඇති පොල් ගස කපා ඉවත් කිරීමට ගෙන ඇති පියවර කුමක් ද?

බුලත්ගම තලාවගෙදර මාර්ගයට අනතුරුදායක ලෙස පිහිටා ඇති පොල් ගස කැපීම සඳහා අවසාන නිවේදනය නිකුත් කරන ලද අතර, එම නිවේදනය අනුව ගස කැපීමට ගස් හිමිකරු ක්‍රියා නොකළහොත් සභාව මගින් කපා ඉවත් කිරීමට තීරණය කර ඇති බව ගරු සභාපතිතුමන් පවසන ලදී.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

**06:01:01** 2023 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ගරු සභාපතිතුමන් විසින් 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතට අනුව බළන්ගොඩ නගර සභාවේ 2023 වර්ෂයට අදාල අය වැය යෝජනාවලිය ගරු සභාවට ඉදිරිපත්

කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් එම අයවැය යෝජනාවලිය ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතට අනුකූලව බළන්ගොඩ නගර සභාවේ 2023 වර්ෂයට අදාල අයවැය යෝජනාවලිය තමන් විසින් සභාගත කළ අතර, එම අයවැය යෝජනාවලියෙහි සංශෝධනයන් තිබේනම් ඉදිරිපත් කරන ලෙස පැවසීය.

එහි දී සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ අතර, පනතානුකූලව සියලු කටයුතු සිදු විය යුතු බැවින් 2023 අයවැය යෝජනාවලිය සම්මත කිරීම හෝ නොකිරීම සඳහා බෙදීමකට යන්නේදැයි ගරු සභාපතිතුමා විමසන ලදී.

ඒ අනුව 2023 අයවැය යෝජනාවලිය සම්මත කිරීමට පක්ෂ බව හා විපක්ෂ බව විමසීම සඳහා බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ස්ථිර කරන ලදී.

ඒ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

ඒ අනුව 2023 අයවැය සම්මත කර ගැනීම සඳහා පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් හය දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 5. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද |

විපක්ෂව සභිකවරුන් එක් අයෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, පහත සඳහන් සභිකවරුන් දස දෙනා එම අවස්ථාවේ සභාවේ නොසිටි ගරු සභිකයන් වේ.

| | |
|---|---|
| 1. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |

3. ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය
9. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා
10. ගරු නාගරික මන්ත්‍රී එස්.ඒ. ජෝර්ජ් මැතිතුමා

ඒ අනුව 2023 වර්ෂයට අදාල අයවැය සඳහා පක්ෂව ඡන්ද 06 ක් ද, විපක්ෂව ඡන්ද 01 ක් ද වශයෙන් වැඩි ඡන්ද 05 කින් සභා සම්මත විය.

**පෙ.ව. 9.19 ට පමණ ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව. 9.21 ට පමණ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව. 9.23 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව. 9.29 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව. 9.34 ට පමණ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව. 9.35 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව. 9.44 ට පමණ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව. 9.50 ට පමණ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව. 9.52 ට පමණ ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය සභාවට පැමිණෙන ලදී.**

**06:01:02** පහත සඳහන් බලතල, රාජකාරී හා වගකීම් පැවරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

i. නගර සභා ආඥා පනතින් හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවකින්, රීතියකින්, නියෝගයකින් හෝ වෙනයම් ලිඛිත නීතියකින් සභාවට පැවරී ඇති සියලු කාර්ය හා බලතල, සභාව වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම උදෙසා සභාපතිවරයාට පැවරීම
ii. රු. 250,000.00 ක් දක්වා වන සභාවේ සියලු වියදම් දැරීම සඳහා වූ සියලු බලතල ගරු සභාපතිවරයාට පැවරීම
iii. රු. 250,000.00 සිට රු. 500,000.00 දක්වා වූ වියදම් මුදල් කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව සිදු කිරීමට සභාපතිවරයාට බලය පැවරීම
iv. අවස්ථානුකූලව තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීම සඳහා වූ සියලු බලතල ගරු සභාපතිවරයාට පැවරීම
v. සභාවේ සහ සභාපතිවරයාගේ බලතල නිළධාරීන්ට පැවරීම
vi. සභාවේ සහ සභාපතිවරයාගේ බලතල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී වෙත පැවරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06෴01෴03 කාරක සභා පත්කිරීම**

**06෴01෴03෴01 මුදල් කමිටුව පත් කිරීම හා බලතල පැවරීම.**

**මුදල් කමිටුවට පැවරෙන බලතල හා විෂය පථය**

බළන්ගොඩ නගර සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන්ට අදාලව රුපියල් දෙලක්ෂ පනස් දහස (රු.250,000.00) සිට රුපියල් ලක්ෂ පහ (රු. 500,000.00) දක්වා වූ වියදම් අනුමත කිරීම, රුපියල් දෙලක්ෂ පනස් දහස (රු.250,000.00) සිට රුපියල් ලක්ෂ පහ (රු. 500,000.00) දක්වා වූ ඇස්තමේන්තු අනුමත කිරීම, ගරු සභාපතිවරයා විසින් සිදු කරනු ලබන රුපියල් දෙලක්ෂ පනස් දහස (රු.250,000.00) සිට රුපියල් ලක්ෂ පහ (රු. 500,000.00) දක්වා වූ ගෙවීම් වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබාදීම, කර්මාන්ත කමිටුව, පුස්තකාල හා උපදේශන කමිටුව, සෞඛ්‍ය සණ අපද්‍රව්‍ය හා පරිසර කමිටුව, සංවර්ධන උපදේශන කමිටුව යන කමිටු වලින් නිර්දේශ කරනු ලබන රුපියල් දෙලක්ෂ පනස් දහස (රු.250,000.00) සිට රුපියල් ලක්ෂ පහ (රු. 500,000.00) දක්වා වූ වියදම් සඳහා අනුමැතිය ලබාදීම, රු. 250,000.00 සිට රු. 500,000.00 දක්වා වූ ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියාත්මක වීම, නගර සභා ආඥා පනත, රජයේ විවිධ රෙගුලාසි, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා හා රීතින් වලට අනුකූල වන පරිදි ආදායම් උත්පාදනය, ආදායම් ඒකරාශී කිරීම, වියදම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා පාලනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ගොඩ නැගීම සඳහා වන යෝජනා ගරු සභාවට ඉදිරිපත් කිරිම හා ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා,

1. ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය
6. ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය
7. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

යන සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත මුදල් කමිටුව පත් කිරීම සඳහා වන යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06෴01෴03;02 කර්මාන්ත කමිටුව**

නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ ඉටු කළ යුතු කර්මාන්ත සම්බන්ධව ප්‍රමුඛතා හඳුනාගෙන නිර්දේශ කිරීම, ප්‍රගතිය අදාළ පරිදි මුදල් කමිටුවට හා ගරු සභාවට ඉදිරිපත් කිරීම, කර්මාන්ත පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම, තෝරා ගන්නා ලද කර්මාන්තකරුවන් පිළිබඳ නිර්දේශ

ලබාදීම යන කාර්යයන් ඉටු කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා වූ

1. ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී ඊ.එම්.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා - කර්මාන්ත කමිටුවේ සභාපති
3. ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රිනී එම්.ශාන්තිලේඛා මැතිතුමිය

යන සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත කර්මාන්ත කමිටුව පත් කිරීම සඳහා වන යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ03;03 පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව**

බළන්ගොඩ නගර සීමාව තුළ මහජනතාවට පොදුවේ බලපානු ලබන සෞඛ්‍ය ගැටලු පිළිබඳ සොයා බැලීම ඒවාට විසඳුම් යෝජනා කිරීම සහ නගරය පිරිසිදු කිරීම සම්බන්ධව පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම, බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ලබාදීම, පාරිසරික සංරක්ෂණ කාර්යයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්දේශ මුදල් කමිටුවට හා සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් අනෙකුත් කාර්යයන් ඉටු කිරීම යන කරුණු උදෙසා

1. ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය - කමිටුවේ සභාපති
3. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය

යන සාමාජිකයින් හය දෙනෙකුගෙන් සමන්විත පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව පත් කිරීම සඳහා වන යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ03;04 පුස්තකාල උපදේශන කමිටුව පත්කිරීම**

පුස්තකාල පොත් මිලදී ගැනීමට නිර්දේශ ලබා දීම, පාඨක සමාජයේ යෝජනා සම්මත කර ගැනීම, පුස්තකාල සංවර්ධන කටයුතු සාකච්ඡා කර යෝජනා මුදල් කමිටුවට /ගරු සභාවට ඉදිරිපත් කිරීම, පුස්තකාල සාමාජික ගාස්තු අඩු හෝ වැඩි කිරීම සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කිරීම, සඟරා නිකුත් කිරීමේ දී ලිපි ලබාගැනීම සහ සංස්කරණ කටයුතු සඳහා සහභාගි කර ගැනීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා

**ගරු නාගරික මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ගේ නියෝජනය**

1. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා - කමිටුවේ සභාපති
3. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රිනී එම්.ජී. ශාන්තිලේඛා මැතිතුමිය
5. ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය
6. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය
7. ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය
8. ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය

**ප්‍රජා නියෝජනය**

9. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක
10. ඩබ්.ඒ.ජයතිලක මහතා
11. ටී.එම්. නෛයිසූර් මිය
12. ධර්මසේන සමරසිංහ මයා
13. එච්.ඒ.කී.අයි. සිරිවර්ධන මයා
14. එම්.ජී.එස්.ඩී. නාවනැල්ල මයා
15. ඉන්ද්‍රානි වීරසේකර මිය
16. අනිල් අල්විස් මයා
17. එම්.ජෙයරාජන් මයා
18. කුසුමා අබේසිංහ මිය
19. ඒ.එල්.අක්බර් අලී මයා
20. ඉන්ද්‍රානි එස්.රත්නායක මිය
21. දයානන්ද බෙනරගම මයා
22. නලීන් ජයසේකර මයා

යන සාමාජිකයන් 22 කින් සමන්විත පුස්තකාල උපදේශන කමිටුව පත් කිරීම සඳහා වන යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ03;05 සංවර්ධන උපදේශන කමිටුව පත්කිරීම**

බළන්ගොඩ නගර සභා සීමාව තුළ පවතින සියලු සංවර්ධන කටයුතු සඳහා සහ ගරු සභාවේ උන්නතිය, ආදායම් ඒකරාශි කිරීම/ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම ආදී සියලු සේවාවන් සඳහා උපදේශනය ලබාදීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා

1. ගරු සභාපති ඩබ්. ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා

**ප්‍රජා නියෝජනය**

9. ගරු පූජ්‍ය මෛත්‍රීමූර්ති ස්වාමීන් වහන්සේ
10. ගරු පූජ්‍ය පියනන්ද ස්වාමීන් වහන්සේ
11. මුස්ලිම් ප්‍රධාන පල්ලියේ පූජකතුමා
12. බළන්ගොඩ නගර සභාවේ හිටපු ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මහතා
13. විශ්‍රාමික විදුහල්පති එම්.ජෙයරාජන් මහතා
14. ආර්.කේ.ඩී. ජයසිංහ මහතා
15. ෆාරුක් හාජ්ජියාර් මහතා
16. බී. එම්. ගුණතිලක මහතා
17. විල්ෆ්‍රඩ් සිසිල් මහතා
18. හර්ෂණ හෙට්ටිආරච්චි මහතා
19. ග්‍රාම නිළධාරී (බළන්ගොඩ නගර වසම)
20. නිහාල් ෆොන්සේකා මහතා
21. නිල්මිණි වනසේකර මිය
22. ඉන්ද්‍රානි රත්නායක මහත්මිය
23. අජන්තා මිය

යන සාමාජිකයන් 23 කින් සමන්විත සංවර්ධන උපදේශන කමිටුව පත් කිරීම සඳහා වන යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**පෙ.ව. 10.45 ට පමණ ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

06:01:03:06 ප්‍රසම්පාදන කමිටුව හා ලංසු විවෘත කිරීමේ කමිටුව පත් කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව
රුපියල් 250,000.00 දක්වා කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව ලෙස,

1. ගරු සභාපති, ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා
2. ලේකම්, ඩී.එම්.ජේ.යූ. ධර්මරත්න මයා
3. ගණකාධිකාරී, එම්. ඩී. එස්. ප්‍රනාන්දු මයා
4. ප්‍රධාන කළමනාකරණ සහකාර, ජී. ඩී. ඒ. සේමපාල මිය
5. වැඩ අධිකාරී, පී.එම්.එස්.සේනාධීර මයා
6. පුස්තකාලාධිපතිනි, උමුදුනි විදානපතිරණ මිය
7. මහජන සෞඛ්‍ය පරීක්ෂක, ඒ.එම්.සී.එල්.ආඳාදොළ මයා
8. පෙර පාසල් පාලිකා, ඩබ්.එම්.සෙව්වන්දි සමන්මලී වීරසිංහ මිය
9. ආයුර්වේද වෛද්‍ය නිලධාරිනි ඩබ්. ඩබ්. සධානා සංජීවනී පුෂ්පකුමාරි මිය
10. ආදායම් අංශ ප්‍රධාන, ඊ.එම්.නදීකා හර්ෂණී මිය

යන සාමාජිකයින්ගෙන් යුත් කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව පත් කිරීම සුදුසු බවට හා ලංසු විවෘත කිරීමේ කමිටුව වශයෙන් ගරු සභාවේ සභික මණ්ඩලය පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් කරන ලද යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:04 දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් නව බස්නැවතුම්පල සහිත වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබා ගත් ණය මුදල් හා වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් ලබා ගත් ණය මුදල් සඳහා 2023 ජනවාරි මස සිට මාස හයක් යනතුරු පොලිය පමණක් ගෙවීමටත්, පළමු මාස හයෙන් පසු මාසිකව ණය වාරික සහ පොලිය ගෙවීමටත් සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.පේ.ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 2023 වර්ෂයේ පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාල වාර්ෂික සැලසුම් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- ප්‍රසම්පාදන සැලැස්ම
- වට රවුම් නඩත්තු සැලැස්ම
- යන්ත්‍ර/උපකරණ ප්‍රසම්පාදන සැලැස්ම
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම
- වීථි පහන් නඩත්තු සැලැස්ම
- වැසිජල කාණු නඩත්තු සැලැස්ම
- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම ( සෞඛ්‍යය කම්කරුවන් 25 දෙනෙකුගේ සේවය මාසිකව මිලදී ගැනීමට අනුමැතිය ලබා ගැනීම)
- වීථි ඇමදීමේ සැලැස්ම
- අභ්‍යන්තර විගණන සැලැස්ම
- ආයතනයේ ගෙවීම් සම්බන්ධ මු.රෙ. 83 යටතේ නිලධාරීන්ට බලතල පැවරීම
- නගරය පිරිසිදු කිරීම කුණු කසළ එකතු කිරීම, බැහැර කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා දෛනිකව කම්කරුවන්ගේ සේවය මිළදී ගැනීමට අනුමැතිය ලබා ගැනීම.
- රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2012 ප්‍රකාරව කර්මාන්තය ප්‍රජා පාදක සංවිධානවලට පිරිනැමීමේදී නගර සභාවේ සභාපතිවරයා, බළන්ගොඩ නගර සභාවේ වැඩ අධිකාරි සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම්කරනු ලබන එක් නියෝජිතයෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
- කර්මාන්ත ලබා දීමේ ගිවිසුම් කෙටුම්පත සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
- කර්මාන්ත අංශයේ නඩත්තු වැඩසටහන, මාර්ග නඩත්තු වැඩසටහන අනුමත කිරීම ( 2023 වර්ෂය සඳහා කම්කරුවන් 25 දෙනෙකුගේ සේවය මාසිකව මිලදී ගැනීමට අනුමැතිය ලබා ගැනීම)
- 2023 වාර්ෂික පුහුණු සැලැස්ම
- 2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛනය

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 2023 වර්ෂයට අදාලව සභාව පවත්වන දිනය තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව 2023 වර්ෂයට අදාලව මහ සභාව සෑම මාසයකම දෙවන අඟහරුවාදා පැවැත්වීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:07 2023 වර්ෂය සඳහා සේවකයන්ගේ සේවා ගිවිසුම් අලුත් කිරීමටත් ඔවුන් නැවත සේවය සඳහා බඳවා ගැනීමටත් සහා අනුමැතිය ලබා ගැනීම

01. එම්.ඩී.ජයන්ති පෙරේරා
02. ආර්. මංගලේශ්වරි
03. ඒ. තමිල් සෙල්වි
04. අයි. ජයරාම්
05. ඩබ්. එල්. චන්ද්‍රසිරි තිලකරත්න
06. පී.ආර්. ශ්‍යාමා
07. එන්. හේමන්ති
08. යූ.ඩී.සුගත් කුමාර
09. කේ.පී.කුසුමලතා
10.කේ. නිල්මිණි ජයරත්න
11. තුසිත ප්‍රසන්න රත්නායක
12. එම්. රොෂාන් ප්‍රනාන්දු
13. එම්. සමීර අරවින්ද ඉන්ද්‍රසිරි
14. ටී.ඩී.සන්ධ්‍යානි
15. එච්.එම්.අනුර ප්‍රේමකුමාර
16. ආර්.කේ.ඩී.නිලන්ති
17. බී.ආර්.ලාල් ගුණරත්න
18. වයි.ඩී.සුදත් සංජය කුමාර
19. එම්.ඩබ්. ඉරෝෂන් හේමන්ත
20. ටී. ඒ. ප්‍රේමසිරි
21. කේ. ඒ. සී. ලක්රුවන්
22. ටී. සුබ්‍රමනියම්
23. බී. ආර්. කරුණාදාස
24. එන්. බී. ගුණපාල
25. කේ. එච්. නිමලදාස
26. කේ. එම්.සම්පත් විජයබණ්ඩාර
27. යූ.එම්.උපාලි මුණසිංහ
28. ආර්.ජයසුන්දර
29. ඩී.ජේ. උපුල් ශාන්ත
30. ඩබ්. ඒ. සමරදාස
31. ආර්. පී.ජයතිලක
32. ඒ. එම්. අජිත් ප්‍රියශාන්ත
33. ශ්‍යාමා සිරිනි සාන්ති

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 බළන්ගොඩ නගර සභාව - 2023 වර්ෂය සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා ගැනීමට අයදුම්පත්‍ර භාර දුන් පහත නම් සඳහන් ශිෂ්‍යත්වලාභීන් වෙත ශිෂ්‍යත්ව ලබා දීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

| **අනු අංකය** | **නම** | **ලිපිනය** | **අධ්‍යන වර්ෂය** | **විශ්ව විද්‍යාලය** | **පාඨමාලාව** |
|---|---|---|---|---|---|
| 01 | පී.පබෝධා මනක්ෂි | උප තැපැල් කාර්යාලය බාරේ,පහළ ඇල්ලෙපොළ, බලංගොඩ | 2019 / 2020 | සබරගමුව | ක්‍රීඩා හා කළමණාකරන |
| 02 | එස්.ඩී.ඩී.සූරියප්පෙරුම | 54/25/J, චෙට්නෝල් පාර, තුඹගොඩ, බලංගොඩ | 2020 / 2021 | ජයවර්ධන පුර | කළමණාකරන |
| 03 | ඒ.පී.ටී.ඩී. වනිගසූරිය | දේගපිටිය,කිරිදිගල,බලංගොඩ | 2020 / 2021 | කොළඹ | කළමණාකරන |
| 04 | යූ. ආර්. සඳීපා උඩවත්ත | අංක 05, වෑ කුඹුර, කොටුගොඩැල්ල, බලංගොඩ | 2020 / 2021 | හොරණ ශ්‍රීපාලි | ප්‍රසංග කලා |
| 05 | කේ. ඩබ්. නිමන්ති හංසිකා | 146/3, මුකලන් වත්ත, කුමාරගම, බලංගොඩ | 2020 / 2021 | උසස් තාක්ෂණ විද්‍යාලය, බදුල්ල | ගිණුම්කරණය |
| 06 | ඩබ්.වී.යුරේෂා දිල්ශානි | 28, ආනන්ද මෛත්‍රිය මාවත, තුඹගොඩ, බලංගොඩ | 2020 / 2021 | ඌව වෙල්ලස්ස | සත්ව විද්‍යාව |
| 07 | ආර්.සී.එන්.වීරකෝන් | 151/11,වැවවත්ත උද්‍යානය,බලංගොඩ | 2020 / 2021 | වයඹ | විද්‍යා |
| 08 | කේ. ස්වේදා | 331, හුණුකුඹුර, බලංගොඩ | 2020 / 2021 | ශ්‍රී ජයවර්ධන පුර | කළමණාකරනය |
| 09 | එච්.අයි.ඩබ්.දූෂ්මන්ත | 316 F,බලංගොඩ ගෙදර, හුණුකුඹුර, බලංගොඩ | 2020 /2021 | සබරගමුව | කලා |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10 | එස්.ඩබ්.චමරි සඳරුවනි | 54, ශ්‍රී සුදර්ශනගම, තුඹගොඩ, බලංගොඩ | 2020 / 2021 | යාපනය | විද්‍යා |
| 11 | ආර්.කේ. පරමි පාරින්ද්‍යා | 523, ඇල්ලෙපොළ, බලංගොඩ | 2019 / 2020 | කොළඹ | නීති |
| 12 | බී.ජී.ඒ. එල්. පී. පාලාගොල්ල | 984/B/3/RE,ශෛලතලාරාම පාර, කිරිදිගල, බලංගොඩ | 2020 / 2021 | කොළඹ | කලා |
| 13 | එච්.එම්.එම්.එම්.මල්ෂාන් බණ්ඩාර | 182/12/ඒ, ගොරොක්ගහමඩ,බලංගොඩ | 2021 | මොරටුව | සැලසුම් හා නිර්මාණ |
| 14 | එන්.වයි.කේ.ඒ.ධර්මසේන | 113/20,ලේඩිස්මිත් වත්ත,රාස්සගල පාර,බලංගොඩ | 2019 / 2020 | සබරගමුව | කෘෂි විද්‍යා |
| 15 | ආර්.ඩී.එල්.උත්පලා කෞමදී ආනන්දරත්න | සිරි මැදුර, ආනන්ද මෛත්‍රිය මාවත,තුඹගොඩ,බලංගොඩ | 2019 / 2020 | කැලණිය | කලා |
| 16 | වඩුවන්නේ නිමේෂා දිල්හානි | 426/බී, උඩ ඇල්ලේපොළ,බලංගොඩ | 2020/ 2021 | ශ්‍රී ජයවර්ධන පුර | කලා |
| 17 | යූ.එම්.ඒ.ඉසුරිකා තිලුක්ෂි | 112/6ඒ, දෙණිය කුඹුර, රාස්සගල පාර, බලංගොඩ | 2020 / 2021 | අග්නිදිග | කළමණාකරන අධ්‍යයන |
| 18 | ඩී.පී.උදයංගනි | 195/2,කුමාරගම,බලංගොඩ | 2020 / 2021 | රුහුණ | වෛද්‍ය |
| 19 | පී. ස්නේහා | 90 /18 බී, රාස්සගල පාර, බලංගොඩ | 2020 / 2021 | අග්නිදිග | සන්නිවේදන අධ්‍යයනය |
| 20 | කේ.එච්.ඩී.එල්. ජයරත්න | 756/බී, වැලිහරනාව,කිරිදිගල, බලංගොඩ | 2020 / 2021 | මොරටුව | පහසුකම් කළමණාකරනය |
| 21 | ඒ.බී.එම්.ඩී.බණ්ඩාර | අංක 313, බූලත්ගම, බලංගොඩ | 2020 / 2021 | ඌව වෙල්ලස්ස | කළමණාකරනය |
| 22 | උඩවෙල ධම්ම මූර්ති හිමි | සිරි සුනන්දාරාම පිරිවෙන් විහාරය, බූලත්ගම, බලංගොඩ | 2019 / 2020 | කැලණිය | සමාජ විද්‍යා |
| 23 | එච්.ඩී.ටී.ප්‍රමුදිකා ප්‍රනාන්දු | අංක 3/6,වෑ කුඹුර, කොටු ගොඩැල්ල, බලංගොඩ | 2021 / 2022 | මොරටුව | බහු අවයවික |
| 24 | එස්.එම්.එෆ්.පාජිදා | බී 51,ෆලීල් හාජියාර් මාවත,බලංගොඩ | 2020 / 2021 | නැගෙනහි ර | ඉස්ලාම් අධ්‍යයනය |
| 25 | එම්.එම්.එෆ්. අෆ්රා | 379 ඒ, දෙහිගස්තලාව,බලංගොඩ | 2019 / 2020 | පේරාදෙණි ය | කලා |
| 26 | එම්.එස්.එෆ්. ෂිම්ලා | 369,දෙහිගස්තලාව,බලංගොඩ | 2020 / 2021 | වවුනියා | තොරතුරු තාක්ෂණය |
| 27 | එම්.ඒ.සී.එෆ්. අෆ්රා | 178/3, කුමාරගම, බලංගොඩ | 2020 / 2021 | යාපනය | වෛද්‍ය |
| 28 | එම්.එම්.ඒ.ඩබ්.මහවත්ත | 271/බී/3/1,හුණුකුඹුර පාර, බලංගොඩ | 2021 / 2022 | ශ්‍රී/ ජයවර්ධන පුර | කළමණාකරන |
| 29 | එම්.එම්.එෆ්.මිශ්හා | 387/1,කහටපිටිය පාර, බලංගොඩ | 2020 / 2021 | අග්නිදිග | කලා |
| 30 | කේ.එම්.අයි.සී.සෝමතිලක | 271/ඩී/3, හුණුකුඹුර පාර,තුඹගොඩ,බලංගොඩ | 2021 / 2022 | රුහුණ | වෛද්‍ය |
| 31 | ඩබ්.එම්.යූ.පී.බණ්ඩාර | 218,සරස්වති පාර, මාලිගාතැන්න, ඇල්ලෙපොළ,බලංගොඩ | 2020 / 2021 | ශ්‍රී/ ජයවර්ධන පුර | වාණිජ්‍ය |
| 32 | ඩබ්.ඩී.එන්.ප්‍රනාන්දු | 459/5, උඩ ඇල්ලෙපොළ,බලංගොඩ | 2020 / 2021 | රජරට | වෛද්‍ය |
| 33 | එච්.ඒ.ඒ.වයි.හෙට්ටිආරච්චි | 279, බූලත්ගම,බලංගොඩ | 2018 / 2019 | රුහුණු | තාක්ෂණය |
| 34 | කේ.එච්.පී. සුරවීර | 198 ඒ/2, කුමාරගම, බළන්ගොඩ | 2019/ 2020 | ශ්‍රී ජයවර්ධන පුර | විද්‍යා |
| 35 | පී.ආර්. දිල්මි නවෝද්‍යා පළිහවඩන | 8/14 බී, කොටුගොඩැල්ල පාර, බළන්ගොඩ | 2020/ 2021 | රුහුණු | වෛද්‍ය පීඨය |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

2023 වර්ෂය වෙනුවෙන් විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා දීම සහ පොත් ලබාදීම සඳහා 6-5-472 ( i ) ශීර්ෂය යටතේ රු.500,000 /- ක මුදලක් වෙන් කර ඇති අතර එක් අයෙකුට රු.10,000 /- බැගින් අයදුම්කරුවන් 35 දෙනෙකු සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා දීමටද අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජිකයන්ට පමණක් ශිෂ්‍යත්ව ලබා දීමේ දී අනෙකුත් දරුවන්ට අසාධාරණයක් වන බැවින් දරුවන්ගේ දක්ෂතාවය ඇගයීම වෙනුවෙන් 2022 වර්ෂය සඳහා ලබා දුන් පරිදිම විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:09 බලංගොඩ නගර සභා තානායම ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

බළන්ගොඩ නගර සභාව මඟින් පවත්වාගෙන යන තානායමෙහි ටෙන්ඩර් කාලය 2023 පෙබරවාරි 28 දිනෙන් අවසන් වන අතර ඉදිරි වසර 05 ක කාලයක් සඳහා විවෘත ටෙන්ඩර් ක්‍රමවේදය මඟින් නව බදුකරුවෙකු තෝරා ගත යුතු බව ගරු සභාපතිතුමා පවසන ලදී.

ඒ අනුව බළන්ගොඩ නගර සභා තානායමේ නව තක්සේරු මුදල වන රුපියල් ලක්ෂ තුනක මාසික කුලිය අවම ලංසු මුදල වශයෙන් ගෙන විවෘත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින් ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 බලංගොඩ නගර සභා තානායම ටෙන්ඩර් කිරීමට පෙර අළුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:11 2023 වර්ෂය සඳහා ගිවිසුම්ගත වීමේ දී හා විවෘත කඩ බක්කි සඳහා ගාස්තු අය කිරීමේ දී නව තක්සේරුව මත පදනම්ව ගාස්තු අය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාවට අයත් මහජන පොළ කඩ, පොළ කඩ, පොළ ගබඩා, මහජන පොළ ආපනශාලාව සහ සතිපොළ විවෘත කඩ බක්කි සඳහා වන තක්සේරු වාර්තාව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති අතර, ඒ අනුව සියලුම කඩ කාමර සහ විවෘත කඩ බක්කි සඳහා ගාස්තු සංශෝධනයක් සිදු වී ඇති බව පවසන ලදී.

එබැවින් 2023 වර්ෂය සඳහා ගිවිසුම්ගත වීමේ දී හා විවෘත කඩ බක්කි සඳහා ගාස්තු අය කිරීමේ දී නව තක්සේරුව මත පදනම්ව ගාස්තු අය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 කාර්යසාධන ණය පියවීම සඳහා වැඩිපුර අය වී ඇති වාරික මුදල් වන රු. 4,342.00 ක මුදල නැවත සරත් ආනන්දසෝම යන අය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:13 කාර්යසාධන ණය පියවීම සඳහා වැඩිපුර අය වී ඇති වාරික මුදල් වන රු. 8684.00 ක මුදල නැවත ඩබ්.සුසන්ත සුගත්සිරි යන අය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:14 බළන්ගොඩ නගර සභාව සතු මැණික් කඩ කාමර සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් ලැබෙන තෙක් 2023 වර්ෂයේ ජනවාරි සිට රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ඇති නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාව සතු මැණික් කඩ කාමරවල දීර්ඝකාලීන බදු ගිවිසුම් කාලය අවසන් වී ඇති බැවින් ඒ සම්බන්ධව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම සඳහා 2022-03-08 දින මාසික මහ සභාවට යොමු කළ අතර, එහි දී ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව නව තක්සේරුවක් මත දැනට සිටින බදුකරුවන් හටම මෙම කඩ කාමර ලබා දීමට අනුමත වූ බව ද ඒ අනුව පළාත් පාලන ආයතනයට වැඩි ප්‍රතිලාභයක් ලැබෙන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් ගැනුම්කරුවන් තෝරා ගැනීමට කටයුතු කළ යුතු බවට ගරු ආණ්ඩුකාරතුමා උපදෙස් ලබා දුන් බව ද පවසන ලදී.

එමෙන්ම මේ සම්බන්ධව වර්තමාන කඩ කාමර බදුකරුවන් දැනුවත් කිරීමේ විශේෂ රැස්වීමක් 2022-08-24 දින පැවැත් වූ අතර, මෙම සාකච්ඡාවේ දී නව තක්සේරුවක් මත දැනට ව්‍යාපාර සිදු කරන වෙළඳුන්හටම මෙම කඩ ලබා දෙන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමා හරහා ගරු

ආණ්ඩුකාරතුමා වෙත ලිඛිතව ඉල්ලීමක් කර එහි උපදෙස් ලැබෙන තෙක් නව තක්සේරු මුදල ගෙවීමට ඉල්ලූ බව ද වැඩිදුරටත් පැවසීය.

ඒ අනුව බළන්ගොඩ නගර සභාව සතු මැණික් කඩ කාමර සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් ලැබෙන තෙක් 2023 වර්ෂයේ ජනවාරි සිට රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ඇති නව තක්සේරුව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:15 2023 වර්ෂය සඳහා පහත සඳහන් ගිවිසුම් කෙටුම්පත් වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

- පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය
- පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය
- පොදු වෙළඳසැල අංක 11,12,14, හා 18 දරණ මාළු කඩ කාමර
- පෞද්ගලික බස්ගාල් ගාස්තු අය කිරීම
- රථවාහන නගරයට ඇතුල් කිරීමේ හා නැවතුම් ගාස්තු අය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:16 බළන්ගොඩ නගර සභාවෙන් සිදුවන සේවාවන් ඇතුලත් වාර්තාමය වීඩියෝපටයක් සකස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වූ ගරු සභාපතිතුමා බළන්ගොඩ නගර සභාව නිරන්තර සම්මානයන්ට ලක්වන හා විවිධ ආයතනයන් තම ක්ෂේත්‍ර අධ්‍යයනයන් සඳහා තෝරා ගනු ලබන රාජ්‍ය ආයතනයක් වන බැවින් සේවාවන් ඇතුලත් වාර්තාමය වීඩියෝපටයක් සකස් කළ යුතු බව ද ඒ සඳහා රුපියල් 30,000.00-50,000.00 ක් පමණ වැය වන බව ද දේශපාලන අධිකාරිය ඇතුලත් නොවන පරිදි එය සකස් කිරීම සුදුසු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බොහෝ ආයතනයන්හි මෙවැනි වාර්තාමය වීඩියෝපට සකස් කර ඇති අතර, මෙය ඉතා වැදගත් බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:17 බළන්ගොඩ නගර සභාවේ කොම්පෝස්ට් අංගනයේ සහ සෞඛ්‍ය අංශයේ සේවයේ නියුතු සෞඛ්‍ය කම්කරුවන් හා රියදුරන් වෙනුවෙන් වෛද්‍ය සායනයක් පැවැත්වීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් නිරාහාර රුධිර සීනි පරීක්ෂාව,සම්පූර්ණ කොලෙස්ටරෝල් පරීක්ෂාව, සම්පූර්ණ මුත්‍රා පරීක්ෂාව සහ අක්මා පරීක්ෂාව සඳහා එක් අයෙකුට රු.1,250.00 බැගින් 50 දෙනෙකු සඳහා රුපියල් 62,500.00 ක් වැය වන බවත්, වෛද්‍ය සායනය සඳහා පැමිණෙන කාර්යය මණ්ඩලය සඳහා සංග්‍රහ කිරීමට රු.8,000.00 ක් වැය වන බවත් පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:18 නිල නිවාස කමිටුව පත් කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව පැහැදිලි කරමින් ජාතික විගණන කාර්යාලයෙන් රජයේ නිල නිවාස තෝරා දීමේ දී නිල නිවාස කමිටුවක් පත් කර ගත යුතු බවට උපදෙස් ලබා දී ඇති අතර, ඒ අනුව නිල නිවාස කමිටු සාමාජිකයන් ලෙස,

- ගරු සභාපතිතුමා
- ලේකම්
- ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
- ගණකාධිකාරී
- වැඩ අධිකාරී යන අය පත් කර ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:19 2023 වර්ෂය තුලදී වාහන ඉන්ධන පරීක්ෂා කටයුතු කිරීම සඳහා පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් යුත් කමිටුවක් පත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- පී.ඩබ්.එස්.සේනාධීර මහතා - වැඩ අධිකාරී
- ආර්.පී.අයි.පී. කුමාර මහතා - සංවර්ධන නිලධාරී
- ඒ.එල්.අසංක පුෂ්පලාල් මහතා - සංවර්ධන නිලධාරී

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:20 සභාව සතුව පවතින SG RX 4400 අංක දරණ ට්‍රේලරය (කම්පැක්ටරය) හා SG RV 8543 ට්‍රේලරය (ගලි ටැංකිය) අලුත්වැඩියා කිරීමට අසීරු තත්ත්වයේ පවතින බැවින් අබලි ද්‍රව්‍ය බැහැර කිරීම යටතේ එම ට්‍රේලර් දෙක ඉවත් කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් SG RX 4400 අංක දරණ ට්‍රේලරය (කම්පැක්ටරය) හා SG RV 8543 ට්‍රේලරය (ගලි ටැංකිය) අලුත්වැඩියා කිරීමට අසීරු තත්ත්වයේ පවතින අතර, ඒ සම්බන්ධව බළන්ගොඩ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සහකාර කළමණාකාර (ඉංජිනේරු) වෙත යොමු කර ලබා ගත් වාර්තාවෙහි මෙම ට්‍රේලර් දෙක අලුත්වැඩියා කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවන බව හා අලුත්වැඩියාව ඵලදායී නොවන බව සඳහන්ව ඇති බැවින් 2022-09-02 දිනැතිව රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් යොමු කර ඇති "අතුරු අයවැය ක්‍රියාත්මක කිරීම,රාජ්‍ය ආයතනවල ගොඩගැසී ඇති අබලි ද්‍රව්‍ය බැහැර කිරීම" ලිපිය යටතේ යොමු කරන ලද ඇමුණුම 01 ට අදාලව මෙම ට්‍රේලර රථ දෙක ඉවත් කිරීමේ ලේඛනයට යොමු කර ඇති බව ද එම ට්‍රේලර ඉවත් කිරීමට සභා අනුමැතිය අවශ්‍ය බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:21 2023 වර්ෂය තුලදී අදාල මීටර පැය ගණන සම්පූර්ණ වූ පසු පූර්ණ සේවා කිරීම/අර්ධ සේවා කිරීම හා 2023 වර්ෂය සඳහා ලියාපදිංචි වී ඇති කේ.ඒ.ඉංජිනියරින් ඇන්ඩ් කේ.ඒ.ඔටෝ ක්ලීන් ආයතනයෙන් හා රිෂානා සර්විස් ආයතනයෙන් මාස තුනකට වරක් මිල ගණන් කැඳවා අදාල ප්‍රසම්පාදන/කමිටු තීරණ මත එම සේවා කටයුතු කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:22 බුලත්ගම සුසාන භූමිය සඳහා සුසාන භූමි භාරකරු වශයෙන් ගිවිසුම්ගතව දීමනා පදනම මත ඩී. ධනුෂ්ක ප්‍රදීප් කුමාර යන අයගේ සේවය ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:23 2022-09-20 දින සිට 2022-10-02 දින දක්වා ක්‍රීඩා පිටියේ පැවැත් වූ සංගීත සැණකෙළියෙන් සිදු වූ හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා තබාගත් ආරක්ෂිත ඇප තැන්පතු මුදලෙන් ඉතිරි රු.500,000.00 ක මුදල නිදහස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2022-09-20 දින සිට 2022-10-02 දින දක්වා ක්‍රීඩා පිට්ටනියේ පැවැත් වූ සංගීත සැණකෙළියෙන් ක්‍රීඩා පිටියට හානි සිදු වීම හේතුවෙන් එම හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා තබා ගන්නා ලද රුපියල් ලක්ෂ 25 ක් වන ආරක්ෂිත ඇප තැන්පතු මුදලින් රු. ලක්ෂ 20 ක් නිදහස් කළ බවද පිට්ටනියේ ස්ථාන කිහිපයක වල ගොඩැලි තත්ත්වයක් පවතින අතර, ග්‍රැවල් පස්

යොදා මට්ටම් කර සම්පූර්ණ ක්‍රීඩා පිටිය තුල රෝල යොදා සනවත් කිරීම සිදු කිරීමෙන් අනතුරුව ඉතිරි රුපියල් ලක්ෂ 05 ක මුදල නිදහස් කිරීමට තීරණය කළ නමුත් පසුගිය කාලය තුල පැවති වර්ෂාව හේතු කොටගෙන එම කාර්යය ඉටු කර ගැනීමට නොහැකි වූ බව ද ඉතිරි මුදල් නිදහස් කර දෙන ලෙස ගිවිසුම්කරු විසින් ඉල්ලීම් ලිපියක් යොමු කර ඇති බව ද පවසන ලදී.

එමෙන්ම ක්‍රීඩා පිටියේ ඉතිරි වී ඇති කාර්යය සඳහා රුපියල් 250,000.00 ක් පමණ රඳවා ගැනීම ප්‍රමාණවත් වන බැවින් ඉතිරි මුදල් නිදහස් කිරීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් ක්‍රීඩා පිටිය යථා තත්ත්වයට පත් වී නොමැති බැවින් එය යථා තත්ත්වයට පත් කර ගන්නා තෙක් රුපියල් ලක්ෂ 05 ක රැඳවුම් මුදල තබා ගැනීම සුදුසු බවත් තමන් මෙම යෝජනාවට විරුද්ධ බවත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසුයේ ක්‍රීඩා පිටිය යථා තත්ත්වයට පත් වී නොමැති බැවින් තමන් මෙම යෝජනාවට විරුද්ධ බවයි.

මේ සම්බන්ධව වැඩ අධිකාරීතුමාගෙන් විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ කරුණු විමසීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පසුගිය සභාවේ දී සාකච්ඡා කල පරිදි ක්‍රීඩා පිටියේ කාණුව සකස් කිරීමට උත්සාහ දැරූ නමුත් කළ නොහැකි වූ බවද ක්‍රීඩා පිටියේ කවදුරටත් පවත්නා ගොඩැලි සහිත ස්ථාන සුදුසු ග්‍රැවල් පස් යොදා සනවත් කිරීම හා සම්පූර්ණ ක්‍රීඩා පිටියම රෝල යොදා සනවත් කිරීම යන කොටස් තවදුරටත් සිදු කළ යුතුව ඇති නමුත් දිගින් දිගටම පැවති අයහපත් කාලගුණික තත්ත්වය යටතේ එම අඩුපාඩු සකස් කිරීමට ගිවිසුම්කරුට අවස්ථාව නොලැබී ඇති බව ද ගිවිසුම් කාලය ඉක්මවා විශාල කාලයක් ගත වී ඇති බැවින් හා ගිවිසුම්කරු විසින් නිරන්තරව කරනු ලබන ඉල්ලීම් සලකා බලා ඉතිරි වී ඇති වැඩ කොටස රු.250,000.00 ක මුදලකට කළ හැකි වැඩ කොටසක් බැවින් රු. ලක්ෂ 05 ක් වන ආරක්ෂිත ඇප තැන්පතු මුදලින් රු. 250,000.00 ක මුදලක් රඳවාගෙන ඉතිරි රු. 250,000.00 ක මුදල නිදහස් කිරීම සුදුසු බව ද පවසන ලදී.

විරෝධතා ඉදිරිපත් වූ හෙයින් මෙම යෝජනාව ප්‍රතික්ෂේප විය.

06:01:24 ටෙන්ඩර්පත් නිකුත් නොවූ පහත සඳහන් කඩ කාමර සම්බන්ධව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සාකච්ඡා කර තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

i. පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය
ii. පොදු වෙළඳසැල අංක 15 එළු මස් කඩ කාමරය
iii. අංක 11 මාළු කඩ කාමරය
iv. සභාව සතු දැන්වීම් පුවරු 10

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය,පොදු වෙළඳසැල අංක 15 එළු මස් කඩ කාමරය,අංක 11 මාළු කඩ කාමරය හා සභාව සතු දැන්වීම් පුවරු 10 වෙනුවෙන් ටෙන්ඩර්පත් නිකුත් නොවූ බැවින් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කර ඇති මුදල වන,

i. පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය - රු. 400,000.00
( මස් සපයා ගැනීම රත්නපුර දිස්ත්‍රික්කය තුල පිහිටි ගෝ ඝාතකාගාරයකින් සිදු කිරීම)

ii. පොදු වෙළඳසැල අංක 15 එළු මස් කඩ කාමරය - රු. 10,000.00
( මස් සපයා ගැනීම රත්නපුර දිස්ත්‍රික්කය තුල පිහිටි ගෝ ඝාතකාගාරයකින් සිදු කිරීම)

iii. අංක 11 මාළු කඩ කාමරය - රු. 10,000.00
( විවෘත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින් ටෙන්ඩර් කිරීම)

iv. සභාව සතු දැන්වීම් පුවරු 10 - රු. 31,250.00
( ප්‍රාදේශීය ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින් ටෙන්ඩර් කිරීම)

ක මුදල අවම ලංසු මුදල වශයෙන් ගෙන 2023 පෙබරවාරි 01 සිට නව ලංසුකරුවන්ට ලබා දෙන පරිදි නැවත ටෙන්ඩර් කිරීමටත්, 2023 ජනවාරි 31 දින දක්වා දැනට සිටින ලංසු හිමිකරුවන් වෙතම ලබා දීම සුදුසු බවටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මන්ත්‍රී යෝජනා**

**07:01 ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

07:01:01 බළන්ගොඩ නගර සභාවේ පුස්තකාල සහයක තනතුර වෙනුවෙන් බළන්ගොඩ, ඕලුගංතොට, නගර සභා පාර, 60/ඒ, ලිපිනයේ එම්.එච්.එස්. කරුණාරත්න යන අය බඳවා ගැනීමට යෝජනා කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:02 **ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

07:02:01 බළන්ගොඩ බස්නැවතුම්පොළෙහි රැඳී සිටින මගී ජනතාවට අසුන් ගැනීම සඳහා එම ගොඩනැගිල්ල ඇතුලේ ඉඩකඩ තිබෙන ස්ථාන දෙකක මගී ආසන සකසා දීමට යෝජනා කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**08:01 2022-12-01 දිනැති මුදල් කමිටු වාර්තාව**

01. ලැප්ටොප් පරිගණකයක් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් විවෘත කිරීම
02. මිල ගණන් විවෘත කිරීම
    I. කර්මාන්ත සඳහා තාර හා කෝලාස්ට් සඳහා කැඳවන ලද මිල ගණන් විවෘත කිරීම
    II. වීථි පහන් උපකරණ හා උපාංග මිලදී ගැනීම
03. HF 8558 ට්‍රැක්ටර් රථයේ අලුත්වැඩියා සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීම
04. RX 2332 ට්‍රේලරය සම්පූර්ණ අලුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම
05. වාහන පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමට කමිටුවක් පත් කිරීම
06. ගබඩාවේ අවසන්ව ඇති කාර්යාලයට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම
07. RX 4440 ට්‍රේලරය(කම්පැක්ටරය) සහ ගලි ටැංකිය අලුත්වැඩියා කිරීමට නොහැකි බැවින් අබලි ද්‍රව්‍ය බැහැර කිරීම යටතේ පළාත් පාලන කොමසාරිස්ගේ අංක PL/7/1/18/3 හා 2022-09-02 ලිපියට අදාලව බැහැර කිරීම සඳහා යොමු කිරීමට අනුමැතිය ලබා ගැනීම
08. යන්ත්‍ර උපකරණ පිළිබඳව සමීක්ෂණයක් සිදු කිරීම සඳහා කමිටුවක් පත් කිරීම

**08:02 තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව**

01. අවම මිල හා පිරිවිතරවල අනුකූලභාවය අනුව PC Systems, No 319 C, Rathnapura Road, Balangoda ආයතනයෙන් Acer A515 Laptop පරිගණකයක් රු. 374,900.00 ක මුදලකට මිල දී ගැනීම සුදුසු බවට නිර්දේශ විය.

08:03 කර්මාන්ත කමිටුව

02.2022 නොවැම්බර් මස කර්මාන්ත අංශය මගින් සිදුකළ කර්මාන්තවල ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීම.

03. මන්ත්‍රී යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ලබා ගැනීම

- ගරු නාගරික මන්ත්‍රී ඊ.ජේ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා (යෝජනා අංක 03:01:01 සිට 03:01:02 දක්වා)
- ගරු නාගරික මන්ත්‍රීනි අයි.ඒ.එම්.ඉලංගකෝන් මැතිතුමිය. ( යෝජනා අංක 03:02:01)
- ගරු නාගරික මන්ත්‍රීනි ජී .චන්ද්‍රලතා මැතිතුමිය ( යෝජනා අංක 03.03.01)
- ගරු නාගරික මන්ත්‍රී නදිශාන් වික්‍රමආරච්චි මැතිතුමා ( යෝජනා අංක 03.04.01 සිට 03:04:04 දක්වා )
- ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ප්‍රේමදාස මැතිතුමා ( යෝජනා අංක 03.05.01 සිට 03:05:02 දක්වා )
- ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය ( යෝජනා අංක 03.06.01)
- ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ( යෝජනා අංක 03.07.01)

04.විශේෂ කරුණු

- ෆලීල් හජ්ජියාර් මාවත ඉතා කඩිනමින් නඩත්තු කරීම
- දෙවට පාර දැඩි ලෙස වල් බිහි වී ඇති බැවින් එම මාර්ගය සුද්ධ කිරීම හා ඇවිදින මංතීරුව සතියකට වරක් සුද්ධ කිරීම

- ලංකා බැංකු මාවත ලෙස දැන්වීම් පුවරුවක් සකස් කිරීම
- දුණුමඩලගහවත්ත මාර්ගය ලෙස නම් කර දැන්වීම් පුවරුවක් සවි කිරීම

බලංගොඩ, අක්කර 18 ,ප්‍රදේශවාසීන් යන ලිපිනයෙහි පදිංචි අය විසින් ඔවුන්ගේ නිවෙස්වලට යාමට ඇති මාර්ගය වලවල් සෑදි අබලන්ව ඇති බැවින් සංවර්ධනය කිරීම

ඉහත සඳහන් කර්මාන්ත වෙනුවෙන් යන්ත්‍ර, සේවකයන් හා රථවාහන ලබාගැනීම සඳහාත්, 2022 දෙසැම්බර් මස කර්මාන්ත අංශය මඟින් සිදුකිරීමට අපේක්ෂිත කර්මාන්ත සහ නඩත්තු කටයුතු ඉටුකිරීම සඳහාත් නිර්දේශය ලබා දීම

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද කාරක සභා වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

**2022-11-01 සිට 2022-11-30 දක්වා ආදායම් හා වියදම්**

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | 20,390,298.92 |
| වෙනත් ලැබීම් | 6,199,350.33 |
| මුලු ලැබීම් | 26,589,649.25 |
| පුනරාවර්තන වියදම් | 9,495,424.51 |
| වෙනත් වියදම් | 1,753,611.50 |
| මුලු වියදම් | 11,249,036.01 |

**2022-11-01 සිට 2022-11-30 දක්වා ඉන්ධන වාර්තාව**

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---:|
| RD-8000 | 19,756.25 |
| 56-1906 | 42,140.00 |
| 227-5020 | 135,020.00 |
| RD - 8240 | 86,000.00 |
| VI1833 | 4,440.00 |
| 226-7521 | 64,500.00 |
| BC-0005 | 54,800.00 |
| GC 0001 | 7,310.00 |
| LL - 7688 | 12,900.00 |
| JD-4684 | 5,920.00 |
| ND-5124 | 116,100.00 |
| PF-4006 | 140,610.00 |
| QL-2901 | 12,950.00 |
| RC-1107 | 68,800.00 |
| RC 1118 | 86,000.00 |
| GK 1483 | 25,800.00 |
| ZA- 5039 | 8,600.00 |
| LL 2110 | 22,240.00 |
| SDRRY0013 | 1,850.00 |
| UQ1933 | 5,920.00 |
| HF 7899 | 47,300.00 |
| GK - 6227 | 21,500.00 |
| RC 8183 | 8,600.00 |
| RB 4786 | 95,800.00 |
| එකතුව | **1,094,856.25** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**10. ඇස්තමේන්තු අනුමත කිරීම**

**11. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය හා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනය විසින් වාර්ෂිකව සංවිධානය කරන හොඳම ගිණුම් හා වාර්ෂික වාර්තාව සඳහා වූ තරගාවලියේ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන අතරින් 2020 වර්ෂයට අදාලව හොඳම ගිණුම් හා වාර්ෂික වාර්තාවට හිමි රන් සම්මානය බළන්ගොඩ නගර සභාව හිමි කර ගත් අතර,ඒ සඳහා කැපවූ ගණකාධිකාරීතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වන බව පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

සභාව සියලු දෙනාගේ සහයෝගයෙන් හා කැපවීමෙන් කරගෙන ආ අතර, ලැබූ සම්මානය වෙනුවෙන් ස්තුතිවන්ත වන බවද ක්‍රීඩා පිටියේ පවතින යම් යම් අඩුපාඩු පවතින වර්ෂාවත් සමග සකස් කිරීමට අපහසු බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් දෙහිගස්තලාව කොට්ඨාසය නියෝජනය කරමින් මන්ත්‍රීවරුන් හතර දෙනෙකු සිටින නමුත් එම කොට්ඨාසයේ කිසිදු මාර්ග නඩත්තුවක් සිදු නොවන බව ද බළන්ගොඩ නගරයේ වීථි පහන් ආලෝකය නොමැති නිසා අඳුරු වී පවතින අතර, මේ සම්බන්ධව සම්බන්ධීකරණ කමිටුවේ දී සාකච්ඡා කළ බව ද පවසන ලදී. එමෙන්ම අද දින සභාවට පැමිණීමේ දී යම් ප්‍රමාදයක් සිදු වූ නමුත් තමන් සභාවේ සිටියේ නම් අයවැයට පක්ෂව ඡන්දය භාවිත කරන බව ද රටේ තත්ත්වය ගැන තේරුම් ගෙන සියලුම දෙනා එකතු වී පක්ෂ භේදයකින් තොරව ගරු ජනාධිපතිතුමාගේ දෑත් ශක්තිමත් කළ යුතු බව ද වැඩිදුරටත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය හා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනය විසින් වාර්ෂිකව සංවිධානය කරන හොඳම ගිණුම් හා වාර්ෂික වාර්තාව සඳහා වූ තරගාවලියේ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන අතරින් 2020 වර්ෂයට අදාලව හොඳම ගිණුම් හා වාර්ෂික වාර්තාවට හිමි රන් සම්මානය බළන්ගොඩ නගර සභාව හිමි කර ගත් අතර,ඒ සඳහා කැපවූ ගණකාධිකාරීතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වන බවද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වශයෙන් 2023 අයවැය සඳහා පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමට අපේක්ෂාවෙන් සිටි නමුත් ලිපිය නිවැරදිව කියවීමට නොහැකි වූ බැවින් පැමිණීම ප්‍රමාද වූ බව ද පවසන ලදී.

**ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා**

ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා අදහස් දක්වමින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය හා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනය විසින් වාර්ෂිකව සංවිධානය කරන හොඳම ගිණුම් හා වාර්ෂික වාර්තාව සඳහා වූ තරගාවලියේ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන අතරින් 2020 වර්ෂයට අදාලව හොඳම ගිණුම් හා වාර්ෂික වාර්තාවට හිමි රන් සම්මානය බළන්ගොඩ නගර සභාව හිමි කර ගත් අතර,ඒ සඳහා කැපවූ ගණකාධිකාරීතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වන බව පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් පසුගිය වර්ෂයේ දී ගරු සභාපතිතුමා ඇතුළු කණ්ඩායම නගර සභාවේ බලය ලබා ගෙන සීඝ්‍ර සංවර්ධනයක් සිදු කරන බවට පැවසූ නමුත් එවැන්නක් සිදු නොවූ බව ද තමාගේ පාලන කාලය තුල අනුමත වී ක්‍රියාත්මක කිරීමට සූදානම් වූ වටිනා ව්‍යාපෘති කිහිපයක්ම අවලංගු කිරීමට කටයුතු කළ අතර, වාහන නැවතුම් ස්ථානයකට ඉල්ලා සිටි නාගරික සංවර්ධන ඉඩම අද වන විට වාහන පුහුණු කරන ස්ථානයක් බවට පත්ව ඇති බව ද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සූර්ය පැනල ව්‍යාපෘතියක් පිළිබඳ කළ යෝජනාව ඉටු කිරීමට කටයුතු සූදානම් කළ නමුත් එය ඉටු කිරීමට පවා තිබූ බල අරගලය නිසා නොහැකි වූ බව ද අයවැය සම්මත නොකළ පසුබිමක වුවද ජනතාවට අවශ්‍ය සේවාවන් ලබා දීම ඉටු කළ නමුත් අද වන විට ජනතාවට අවශ්‍ය සේවා නිසි පරිදි නොලැබෙන බව ද පවසන ලදී.

එමෙන්ම තමාගේ පාලන කාලයේදී නොලැබුණු විගණන විමසුම් අද වන විට ලැබෙන අතර, හොඳ විගණන විමසුම් මතයක් නොලැබුණහොත් වාර්ෂික වාර්තාව හා ගිණුම් සඳහා වන සම්මානය ලබා ගැනීමට පවා නොහැකි වන බවද සභාවට යම්කිසි ජයග්‍රහණයක් ලැබුණේ නම් එය නිලධාරීන්ගේ දක්ෂතාවය නිසා ලැබුණක් බව ද ගරු සභාපතිතුමා  විශාල වශයෙන් චෝදනා එල්ල කළ ගරු ජනාධිපති  රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආරක්ෂාව යටතේ පොදු ජන පෙරමුණෙහි සියලු දෙනා ආරක්ෂා වී සිටින බව ද වැඩිදුරටත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් සභාවේ සිටින මන්ත්‍රී සංඛ්‍යාව අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා ඇති බවද සියලු දෙනා එකතු වී මෙම රට ගොඩ නැගිය යුතු අතර, කරනු ලබන හොඳ දේ වෙනුවෙන් සහයෝගය ලබා දෙන නමුත් වැරදි දේ විවේචනය කරන බව ද වසන්ත ගුණරත්න නැමැති පුද්ගලයා නොව වර්තමාන ගරු සභාපතිතුමා පිළිබඳව තමාගේ විශ්වාසයක් නොමැති බව ද අයවැය සම්මත කරනු ලබන අවස්ථාවේ දී තමා සභාවේ සිටියේ නම් අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන බව ද ලබන්නා වූ නව වසර නිදුක් නිරෝගී වාසනාවන්ත නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් සභාවේ සංවර්ධන කටයුතු සිදු නොවූ බවට චෝදනා කරනු ලැබුවද සභාවේ බලය ලබා ගත් මුල් මාස කිහිපයේ දී එම කටයුතු සිදු කළ බව ද ඉන්පසුව පැවති ආර්ථික අර්බුදය හමුවේ රට තුල සංවර්ධන කටයුතු සිදු නොකළ බැවින් යම් පසුබෑමක් වූ අතර, භාණ්ඩ මිල ඉහළ යාම සමඟ කම්කරු වැටුප ප්‍රමණවත් නොවන බැවින් කම්කරුවන් වෙනත් කටයුතු සඳහා යොමුව ඇති නිසා කම්කරු හිඟයක් පවතින බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා ලබන්නා වූ නව වසර වාසනාවන්ත නව වසරක් වේවා හා සුබ නත්තලක් වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් සභාවට හා කර්මාන්ත කමිටුවලට යොමු කරනු ලබන යෝජනා ක්‍රියාත්මක නොවන විට කණගාටුවක් ඇති වන බව ද දෙල්ගස්වත්ත මාර්ගයේ අසීරු කොටසක්

පවතින අතර, එය සකස් කර දෙන ලෙසද අදාල ආයතන සම්බන්ධ කරගෙන ආනන්ද මෛත්‍රී මාවත සුද්ධ කර දෙන ලෙසද සුදර්ශනගම පාර ජේසීබී යන්ත්‍රයක් යොදා වාහනයක් ගෙන යා හැකි පරිදි සකස් කර දෙන ලෙසද වාර්ෂික වාර්තාව සඳහා ලැබූ සම්මානය පිළිබඳව සුබ පැතුම් එක්කරන බව ද ලබන්නා වූ නව වසර වාසනාවන්ත නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් සභාවට තේරී පත් වී මේ වන විට වසර 04 ඉක්මවා ඇති නමුත් බලාපොරොත්තු වූ වැඩ කටයුතු ඉටු කර ගැනීමට නොහැකි වූ බව ද ගම්පෙරළිය වැඩසටහන මඟින් විශාල වැඩ කොටසක් ඉටු කළ අතර, කර්මාන්ත කමිටුවේ දී සාකච්ඡා කළ පරිදි දෙසැම්බර් මාසයේ දී ඉටු කිරීමට නියමිත නඩත්තු කටයුතු සිදු කරන ලෙසද පසුගිය දිනක ලැබූ සම්මානය සඳහා පැවැත් වූ කෙටි උත්සවයට තමන්ට සහභාගී වන ලෙස ආරාධනා නොලැබුණු බැවින් ඒ සම්බන්ධ කණගාටුවට පත්වන බව ද ලබන්නා වූ නව වසර වාසනාවන්ත නව වසරක් වේවා හා සුබ නත්තලක් වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් සම්මානයන්ට පාත්‍රවන බළන්ගොඩ නගර සභාවේ අවුරුදු 05කට ආසන්න කාලයක් සේවය කිරීමට හැකිවීම සතුටක් බව ද ජනතාවට සේවය කිරීමට පැමිණි නමුත් බලාපොරොත්තු වූ තරම් සේවයක් කිරීමට නොහැකි වූයේ යම් යම් සංවර්ධන කටයුතු ගරු ආණ්ඩුකාරතුමා විසින් වළක්වාලූ නිසා බව ද පැවසීය.

තමන් නිරන්තරයෙන් කතා කළ තුඹගොඩ පන්සලේ මගී නැවතුම්පළ මේ වන තෙක් ඉදි කිරීමට අපොහොසත් වී ඇති බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙසද පොළ භූමියට ජලය සපයා ගැනීම සිදු කරන ලෙසද පසුගිය කාලයේ අතයට ගනුදෙනු සිදු වූ අතර ඉදිරියට එසේ විය හැකි බව ද බස්නැවතුම්පළ කඩ පේළියක් පිටුපස බැම්මක් ඉදි කරන අතර, එය නිසි ක්‍රමවේදයකින් සිදු වන්නේදැයි සොයා බලන ලෙසද ආයුර්වේදයේ ඉඩමේ කොටසක් ඒ සඳහා එකතු වන බවද තවත් කණ්ඩායමක් නගර සභාවේ ඉඩම් ගැන සොයා බලන බව ද පාර්ලිමේන්වේ සිට බිම් මට්ටම දක්වා යන ක්‍රමවේදය වැරදි නිසා අයවැය වෙනුවෙන් තම විරෝධය පළ කළ බවද වැඩිදුරටත් පවසන ලදී.

එමෙන්ම කාන්තා මන්ත්‍රීවරියන් 75% ක්වත් පත් විය යුතු බව ද ලබන්නා වූ නව වසර වාසනාවන්ත නව වසරක් වේවා හා සුබ නත්තලක් වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ප.ව. 12.00 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පසුගිය දිනක ලැබූ සම්මානය සඳහා කැප වූ ගණකාධිකාරීතුමාට සුබ පැතුම් එක් කරන බවද එතුමා වැඩ බලන රත්නපුර මහ නගර සභාව සඳහා ද එකී සම්මානය ලබා දීමට කටයුතු කර ඇති බැවින් දක්ෂ නිලධාරියෙක් බවද තමන් නගර සභාවට පත්ව පැමිණියේ ජනතාවට උපරිම සේවය ලබා දීමට වන අතර, එය ඉටු කර ගැනීමට හැකි වූ බවද ඒ සඳහා හිටපු ගරු සභාපතිතුමා හා වර්තමාන සභාපතිතුමාට ස්තුතිවන්ත වන බවද පවසන ලදී.

එමෙන්ම රට තුල පවතින දේශපාලන වාතාවරණය සතුටුදායක නොවන අතර, ණය වාරික නොගෙවන නිසා 2023 මාර්තු මාසය වන විට අසාදුලේඛන ගත විය හැකි බව ද ආයතන පෞද්ගලීකරණය කරමින් පවතින අතර, විදුලි බල මණ්ඩල සේවකයෙන් වශයෙන් තමාගේ රැකියාව පවා අහිමි වන තත්ත්වයකට පත්ව ඇති බව ද පෞද්ගලීකරණය කිරීම නිසා ඩොලර් බිලියන 02ක් ඉතුරු කර ගැනීමට හැකි වුවත් එය මාස කීපයකට පමණක් ප්‍රමාණවත් වුවත් ඉන්පසු රට ගමන් කරන්නේ කෙසේද යන්න ගැටලු සහගත බව ද ජනවාරි මාසයේ කම්කරු වන්දි පනත සංශෝධනය කරන අතර, එහි දී වන්දි මුදල අඩු කර රුපියල් ලක්ෂ 05ක් වැනි මුදලක් ලබා දී රැකියා අහිමි කිරීමක් සිදු කළ හැකි බව ද පවසන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා තමන්හට ඉදිරියේ පැවැත්වෙන ඡන්දයට ඉදිරිපත් වීමේ බලාපොරොත්තුවක් නොමැති අතර, එළඹෙන 2023 වර්ෂය සියලු දෙනාට වාසනාවන්ත සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා අදහස් දක්වමින් ආර්ථික අර්බුදය ඇති වූ අවස්ථාවේ මූලික ගැටලු විසඳා ගැනීම සඳහා ලෝක බැංකුව විසින් ඩොලර් බිලියන 600 ක ආධාර මුදලක් ලබා දුන් අතර, ඉන්ධන ලබා ගැනීමට පුද්ගලික සමාගම් 08කට අවසර ලබා දී ඇති බව ද තෙල් නැවකට ගෙවීමට තරම්වත් මුදල් රජයට නොමැති බවද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන ඩොලර් බිලියන 2.9ක මුදල සංචිතයක් වශයෙන් පවත්වා ගැනීමට ලැබෙන බැවින් එය වියදම් කිරීමට නොහැකි බව ද ඔවුන් විසින් දේශපාලන ස්ථාවරත්වයක් ඇති කර ගන්නා ලෙස දන්වා ඇති අතර, ඒ සඳහා මැතිවරණයකට යා යුතු බව ද පවසන ලදී.

එමෙන්ම අරගලය නැවත මතුවිය හැකි අතර, ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා රට යහපත්ව පැවති කාලයේ නොකල දෑ දැන් කරාවි යැයි විශ්වාස කළ නොහැකි බව ද එතුමාට ජනමතයක් නොමැති අතර, රට භාරගත්තා නොව භාරදුන් බව ද මෙම ක්‍රමය තුල විසඳුම් නොමැති අතර, වෛද්‍යවරු, ඉංජිනේරුවන් වැනි බුද්ධිමතුන් හා විශාල වශයෙන් තරුණ පිරිස් මෙරටින් පිටවන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් අනඳමෙත්ගම කාපට් කළ මාර්ගයේ අඩුපාඩු සම්බන්ධව ගත් ක්‍රියාමාර්ගය කුමක්දැයි විමසූ අතර, සභාව පැවැත්වෙන වෙලාව පිළිබඳව ඇති වූ අතපසුවීමක් නිසා අයවැය සම්මත කරන අවස්ථාවට පැමිණීමට නොහැකි වූ බව ද පසුගිය කාලයේ සිදු වූ යම් යම් සිද්ධීන් පිළිබඳව ඇති වූ අපැහැදීම හා අවුරුදු 04 ක කාලයක් තුල ජනතාවට, නගරයට සංවර්ධන කටයුත්තක් හෝ වෙනත් ව්‍යාපෘතියක් හෝ සිදු කිරීමට නොහැකි වීම නිසා අයවැය සඳහා විපක්ෂය ඡන්දය භාවිත කිරීමට සූදානමින් සිටි බවද ජනතාවට සේවයක් නොකර සභාව පැවැත්වීම අනවශ්‍ය වියදමක් හෙයින් මෙය විසුරුවන්නේ නම් හොඳ බවද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ප.ව. 12.45 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**ප.ව. 12.45 ට පමණ ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**12. අවසානය**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2022 වර්ෂ අවසාන සභාව අද දින පැවැත්වූ අතර, තමන් සභාපති වශයෙන් පත් වූ දා සිට කිසිවෙකුගේ සිත් රිදවීමට අපේක්ෂාවක් නොමැති වූ බවද පක්ෂ විපක්ෂ බව නොබලා සියලු දෙනාට උදව් කළ අතර, නීත්‍යානුකූලව කටයුතු කිරීම නිසා හිතවතුන් පවා තරහ වූ බව ද අයවැය සඳහා පැවැත් වූ සාකච්ඡාවට ගරු මන්ත්‍රීවරුන් තිදෙනෙකු පමණක් සහභාගී වූ අතර තමන් තමන්ගේ වගකීම් ඉටු කරේදැයි හෘදසාක්ෂියෙන් විමසා බලන ලෙසද පවසන ලදී.

එමෙන්ම පක්ෂ නායකයන්ගේ වැඩපිළිවෙල මත විශාල වැඩ කොටසක් සිදු කිරීමට අපේක්ෂා කළ නමුත් පසුගිය කාලයේ පැවති තත්ත්වයන් මත එය ඉටු කිරීමට නොහැකි වූ නමුත් සභාවේ ආදායම වැඩි කිරීමට යම් යම් ක්‍රියාමාර්ග ගත් බව ද තමන් කිසි දිනක සොරකම් නොකල අතර, වරින් වර ඇතැම් පුද්ගලයන් මුදල් ලබා දීමට උත්සාහ කළත් එම මුදල් ලබා නොගත් බව ද අද දින අයවැය සඳහා පක්ෂව 12 දෙනෙකුගේ ඡන්දය ලැබීමට නියමිතව තිබූ නමුත් සභාව පැවැත්වීම සඳහා අවශ්‍ය බහුතරය සම්පූර්ණ වූ පසු සභාව ආරම්භ කළ බවද බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ මව්වරුන් හා දරුවන්ගේ ආහාර සුරක්ෂිතතාවය වෙනුවෙන් 2023 අයවැය මගින් රුපියල් කෝටියක මුදලක් වෙන් කළ අතර, අයවැයට විරුද්ධ වීම එම මව්වරුන් හා දරුවන් වෙත විරුද්ධ වීමක් නේදැයි විමසන ලදී.

තවදුරටත් අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, හිටපු ගරු සභාපති චමික ජයම්ණි විමලසේන මැතිතුමා සභාපති වශයෙන් බලයට පත් වූ පළමු වසර දෙක තුල විශාල වැඩ කොටසක් කිරීමට හැකියාව තිබූ නමුත් නොහැකියාව මත එය ඉටු කර නොගත් බවද ශ්‍රී ලංකාවේ හොඳම වාර්ෂික වාර්තාව හා ගිණුම් වර්තාවට හිමි සම්මානය ලබා ගත් අවස්ථාවට පවා තමන් සහභාගී නොවීමට තීරණය කර තිබුණු නමුත් දැඩි ඉල්ලීම මත සහභාගී වූ බව ද එහි දී මෙම සම්මානයන් ලබා දීමට කැප වූ නිලධාරීන් වෙත මෙතෙක් කාලයකට ඇගයීමක් නොලැබුණු බව දැනගන්නට ලැබූ අතර, ඒ හේතුවෙන් තමාගේ පුද්ගලික ධනය වැය කර ඇගයීම් උත්සවයක් ක්ෂණිකව සූදානම් කළ බව ද එම අවස්ථාවට සහභාගී වන ලෙස ඇතැම් මන්ත්‍රීවරුන්ට දැනුම් දීමට නොහැකි වූයේ ක්ෂණිකව සූදානම් කළ වැඩසටහනක් නිසාවෙන් බව ද පවසන ලදී.

එමෙන්ම බළන්ගොඩ නගර සභාව සම්මානයන්ට පාත්‍ර වන්නේ නිලධාරීන්ගේ දක්ෂතාවය නිසා වන අතර, එම නිලධාරීන් 20 දෙනෙකු ස්ථාන මාරු කර ඇති බව ද ගරු ආණ්ඩුකාරතුමා හා ප්‍රධාන ලේකම්තුමා වෙත කරන ලද ඉල්ලීම් පවා නොසලකා හැර ඇති බව ද ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමා තුඹගොඩ මගී නැවතුම්පළ සම්බන්ධව ගැටලුවක් මතු කළ නමුත් එම නැවතුම්පල ඉදි කිරීමට නොව පන්සලේ කාණුව සකස් කිරීම තමන් පොරොන්දු වූ බවද ඒ අනුව එහි වැඩ කටයුතු කළ අතර, මගී නැවතුම්පළ ඉදි කිරීමට විහාරාධිපති හිමිගේ අවසරය ලබාගෙන තමාට එය ලබා දුන් පසු ඉදිරි වැඩ කටයුතු කරන බවද පැවසීය.

අනතුරුව 2023 වර්ෂය සියලු දෙනාට වාසනාවන්ත සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පළ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.12.55 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,<br>
සභාපති,<br>
බළන්ගොඩ නගර සභාව.